# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2009**

**(2010 මැයි / ජූනි)**

**සමාජීය විද්‍යා පීඨය**

**දේශපාලන විද්‍යාව - POLS –E2025**

**පෙරදිග හා බටහිර දේශපාලන චින්තනයේ වර්ධනය**

**<u>ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න</u>**

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි | කාලය : පැය 03 යි

---

01. 'දේශපාලන දර්ශනය වූ කලි සමකාලීන දේශපාලන, සමාජ ආර්ථික පරිසරයේ ම කැඩපතකි.' විමසන්න.

02. රාජ්‍ය පාලනය සඳහා බෞද්ධ දර්ශනය තුළින් පෙන්වා දී තිබෙන උපදේශ සදාචාරාත්මක බවකින් යුක්ත වේ. පැහැදිලි කරන්න.

03. ඇරිස්ටෝටල්ගේ (Aristotle) දේශපාලන චින්තනයෙහි අන්තර්ගත මූලික ඉගැන්වීම් සඳහන් කරමින් ඒවායේ කාලීන වැදගත්කම පරීක්ෂා කරන්න.

04. ප්ලේටෝගේ (Plato) පරමාදර්ශී රාජ්‍ය සංකල්පය විමසා දාර්ශනිකයන් රජකරවීමේ යෝග්‍යතාවය ඔහු සනාථ කළේ කෙසේදැයි විමසීමක් කරන්න.

05. ශාන්ත තෝමස් ඇක්වයිනාස් (St. Thomas Aquinas) ක්‍රිස්තියානි ඇරිස්ටෝටල් ලෙස හඳුන්වන්නේ කුමන හේතු පදනම් කරගෙනදැයි සාකච්ඡා කරන්න.

06. ශාන්ත තෝමස් ඔගස්ටින් (St. Thomas Augustine) රාජ්‍ය පිළිබඳව ඉදිරිපත් කරන ලද අදහස් මධ්‍යතන යුගයේ ක්‍රිස්තියානි පරමාදර්ශවලට අනුව සකස් කරන ලද ආකාරය පෙන්වා දෙන්න.

07. "නිකොලොයි මැකියාවෙලීගේ (Niccolò Machiavelli) සහ ජීන් බොඩැන්ගේ (Jean Bodin) මතවාද නූතන රාජ්‍යයට න්‍යායාත්මක පදනම ලබාදීමට සමත්වුණි ". මෙම අදහස පරීක්ෂා කරන්න.

08. මාක්ස්වාදී දර්ශනයේ මූලිකාංග පරීක්ෂා කරන්න.

09 පහත සඳහන් මාතෘකා දෙකක් (02) පිළිබඳව සටහන් ලියන්න.

   i. පදුවාහි මාසිලියෝ (Marsilio of Padua)
   ii. කොන්ෆියුෂියස් (Confucius)
   iii. පොලිබියස් (Polybius)
   iv. පැරණි ඉන්දියාවේ පැවති හින්දු දේශපාලන ආයතන

*****************************